# බ්‍රහ්මචාරි වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා

**බ්‍රහ්මචාරි වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා අභාවප්‍රාප්ත වී හෙට 13 වැනිදාට වසර 109ක් සපිරේ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**

එතුමා 1876 ජුලි මස 09 වැනිද වලිසිංහ හෙන්ද්‍රික් ද සිල්වා හා ජේහැන්දි මර්තිනා ද සිල්වා ගුණසේකර යන දෙපලට දාව එඩ්වඩ් ද සිල්වා නමින් මීගමුව මහහුණුපිටිය ග්‍රාමයේදී උත්පත්තිය ලැබීය. එඩ්වඩ් ද සිල්වා දරුවාට මහහුණුපිටිය ශ්‍රී සුගතාරාම විහාරස්ථානයේ ධම්මරතන නායක ස්වාමීන් වහන්සේ අත්පොත් තැබූහ. මහහුණුපිටියේ මීගහ ළඟ ඉස්කෝලේ නමින් හඳුන්වනු ලැබූ පාසලෙන් 4 වන ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබා පසුව මීගමුව නගරයේ පිහිටි ශාන්ත මේරි මිෂනාරි පාසලට ඇතුළත් විය. කොළඹ වෙස්ලි විද්‍යාලයට ඇතුළු වී 1889 සිට 1895 දක්වා අධ්‍යාපනය ලබා පසුව එතුමා නීති විද්‍යාලයට ද ඇතුළත් විය. නීතිය පිළිබඳව හැදෑරුව ද ඔහු සමාජය තුළ වඩාත් ප්‍රචලිත වූයේ ආගමික/ සමාජයීය සේවකයකු හා අධිරාජ්‍ය විරෝධියකු ලෙස ය.

වයස අවුරුදු 19දී තම නම ඊ.ඩී.එස්. වලිසිංහ ලෙස වෙනස් කරගත් අතර 1898 ජුලි 01 දින සිට මහාචෛතිය පරිවේනාධිපති පඤ්ඤමෝලිතිස්ස ස්වාමීන්වහන්සේගේ අනුශාසනාව පරිදි ඊ.ද එස්. වලිසිංහ හරිස්චන්ද්‍ර යන නාමය භාවිතා කරන්නට විය. අධිනීතිඥයකු වීමේ අභිලාෂය අතහැර දමා නිදහස් සටන වෙනුවෙන් තවදුරටත් ඇපකැප වී සමාජ සේවයෙන් ආගමික පුනර්ජීවයක් ඇති කිරීමටත් සමාජය දුරාචාරයෙන් වළකාලීමටත් තම කාලය ශ්‍රමය හා ධනය නිරතුරුව වැය කරන්නට විය.

වලිසිංහ හරිස්චන්ද්‍ර අනාගරික ධර්මපාල තුමාගේ මග යමින් සුරාපානයේ දෙස් දක්වමින් රට පුරා නිරන්තරයෙන් කරන ලද කතා අතිශය ප්‍රසිද්ධියට පත්විය. 1898 ජුලි 30 වැනිද සිට හරිස්චන්ද්‍ර තරුණයා බ්‍රහ්මචාරි දිවියකට ඇතුළත් වූයේය.

අනගාරික ධර්මපාලතුමාගේ ජාතික නිදහස ලබාගැනීම හා බුද්ධගයාව බේරාගැනිම සඳහා වූ සාමකාමී අරගලයේ ක්‍රියාකාරියකු වූ එතුමා 1899 සිට 1913 දක්වා මහාබෝධි සමාගමේ ප්‍රධාන ලේකම් ධුරයේ කටයුතු කළේය.

ශතවර්ෂ ගණනාවක සිට අතහැර දමා තිබූ භූමියක් වූ අනුරාධපුර පූජා නගරය හා මිහින්තලේ නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා එතුමාගේ ''බෞද්ධයිනි නැගිටිව් අනුරාධපුරය බේරා ගනිව්'' යන



සාමකාමී අරගලය 1895 ජනවාරි 18 වැනිද ශ්‍රී මහා බෝධිය අසලින් ආරම්භ කෙරිණි.

1902 දී නාරන්විට සුමනසාර නාහිමි සමඟ ස්වර්ණමාලි චෛත්‍ය වර්ධන සමිතිය පිහිටුවන ලද අතර, එතුමා එහි සභාපතිත්වය දරමින් රුවන්වැලිසෑය ප්‍රතිසංස්කරණය හා ආරක්ෂා කිරීම සඳහා මහත් මෙහෙයක් ඉටු කළේය. අනගාරික ධර්මපාලතුමාගේ මගපෙන්වීම යටතේ අමද්‍යප ව්‍යාපාරයෙහි ද පුරෝගාමිකයකු වූ බ්‍රහ්මචාරි වලිසිංහ හරිස්චන්ද්‍ර රටපුරා යමින් සිංහලයා සුරාපානයෙන් බේරා ගැනීමෙහිලා මද්‍යපානයේ දෙස් දක්වමින් රටපුරා දේශන 1363ක් පැවැත්වීය.

වලිසිංහ හරිස්චන්ද්‍රතුමා තම දිවියේ 37 වැනි වියේදී සියලුම ජාතික ශාසනික සේවාවන් අතහැර සඳහටම නිහඬ වූයේ සියල්ලෙහි අනිත්‍යතාව පිළිබඳව අන් අයට පණිවිඩයක් දෙමිනි.

බ්‍රහ්මචාරි වලිසිංහ හරිස්චන්ද්‍රතුමා ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් වූ නිර්වාන සම්පත්තිය ලබාගැනීමට එතුමා ජාතිය හා බෞද්ධාගම වෙනුවෙන් සිදුකළ සියලු පින් කුසල් හේතු වාසනා වේවායි! ප්‍රාර්ථනා කරමි.

**මීගමුව හරිස්චන්ද්‍ර විද්‍යාලයීය ජ්‍යෙෂ්ඨ ආදිශිෂ්‍ය සංගමයේ නියෝජ්‍ය සභාපති ලුතිනන් කර්නල්**

**නාරද වනිගසිංහ**